දඹදෙණි යුගයේ විරචිත සද්ධර්මරත්නාවලිය ග්‍රාම්‍ය ප්‍රකෘති ජීවිතය විචිත්‍රත්වයෙන් ප්‍රතිබිම්බනය කරන්නකි

The Saddharmarathnawaliya, composed during the Dambadeniya period, vividly reflects the rural way of life in all its diversity

ආචාර්ය රංජිත් සේනානායක

Abstract

Dharmasena Thero's Saddhammarathnavali is the great result of the advancement of Science in the Dambadeni period. This book, which is a great work of discourse literature, is an adaptation of her Pali Dhamma Padatta story. That is why Rathnavaliya, which had been praised by the critið of today, shows not only the life experiences of the author but also the creative skills of a nature intellectual.

Apart from the story of Pali Dhammapadatta, other books scattered in pali literature such as Milinda Pannaya, Digsagi commentary, Sutta nipata commerfary, Buddha vansa Pali were written from the source. Therefore, the purpse of this article is to emphasize that the gunius of the writer is revealed.

Darmasena Thero was a polymath who was nourished by Kaulaki as well as Levlaki. A scholar. A greas literary man who understands the world well. A master at convefing poetic thoughts. He was full of compassion who loved the field the threshing floor, the village environment, nature and animal world.

The writing style and language skills used by

Dhamsenevi Thero, who honed his skills by sinking to the bottom of the rural life, ars a little surprising to scholars, The author Saddharmarathnavali is a writer who explained the facts of Dhamma to the common people with a clevar understanding of karma and the Karmapala through similes, prastha pirulu, rupakalankare interesting speeches etc.

සාරසංක්ෂේපය

දඹදෙණි යුගයේ ශාස්ත්‍රෝන්නතියේ විශිෂ්ට ප්‍රතිඵලය ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලිය යි. බණ කථා සාහිත්‍යයේ සුවිශාල කෘතියක් වන මේ ග්‍රන්ථය පාලි ධම්මපදට්ඨ කතාවේ අනුවර්තනයකි. ඒ නිසා ම වර්තමාන විචාරකයන්ගේ පැසසුමට බඳුන් වූ රත්නාවලිය තත් කතුවරයාගේ ජීවිත අත්දැකීම් පමණක් නො ව පරිණත බුද්ධිමතෙකුගේ නිර්මාණ කෞශල්‍යය ද විද්‍යමාන වන්නකි.

ධම්මපදට්ඨ කතාව හැරුණු කොට මිලින්ද පඤ්ඤාය, දිග්සඟි අටුවාව, සුත්ත නිපාත අටුවාව, බුද්ධවංශ පාලිය යනුවෙන් තවත් පාලි සාහිත්‍යයේ විසිරී ගිය පුස්ථක මේ සඳහා මූලාශ්‍රය කර ගෙන රචිත සද්ධර්මරත්නාවලිය ලේඛකයාගේ ප්‍රතිභාව ප්‍රකට කරන්නක් ලෙස අවධාරණය කිරීම මේ ලිපියේ අරමුණ වේ.

කව් ලැකියෙන් මෙන් ම ලෙව් ලැකියෙන් ද පෝෂණය වූ ධර්මසේන හිමීහු බහුශ්‍රැතයෙකි. විශාරදයෙකි. ලෝකය පිළිබඳ ව මනාව අවබෝධ කර ගත් විශිෂ්ට සාහිත්‍යධරයෙකි. කාව්‍ය චින්තන පහළ කරලීමෙහි දක්ෂයෙකි. කුඹුරට, ගොයමට, කමතට, ගැමි පියසට, ගැමි පරිසරයට, සොබා දහමට තිරිසන් සත්වලෝකයට ද බෙහෙවින් ආදරය කළ දයානුකම්පාවෙන් පිරිපුනෙකි.

ග්‍රාම්‍ය ප්‍රකෘති ජීවිතයේ පතුළට ම කිඳා බසිමින් සිය කුසලතා ඔප් නැංවූ දම්සෙනෙවිතුමෝ භාවිතයට ගත් රචන ශෛලිය හා භාෂා සම්ප්‍රදාය විද්වතුන්ගේ ද අමන්දානන්දයට පත් කරවන සුලු ය. උපමා රූපක, ප්‍රස්තාව පිරුළු, රූපකාලංකාර,

රසවත් භාෂණ ආදිය බහාලමින් කථා ගොඩ නැංවූයේ පොදු ජනයාට දෘෂ්ටාන්තව දහම් කරුණු පැහැදිලි කරමින් කර්මය හා කර්ම ඵලය පිළිබඳ ව තත්වාබෝධය ලබා දෙමින් ය.

ප්‍රමුඛ පදඃ සද්ධර්මරත්නාවලිය, ධර්මසේන හිමි, අනුවර්තනය, කව් ලැකිය. ලෙව් ලැකිය, ප්‍රතිභාව, කෞශල්‍යය, නෛපුණ්‍යතාව, ප්‍රස්තාව පිරුළු, උපමාලංකාර

හැඳින්වීම

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය සංකේතවත් කරන දඹදෙණි යුගයේ විරචිත සද්ධර්මරත්නාවලිය බණ කථා සාහිත්‍යයේ ප්‍රථම කෘතිය යි. මූලික වශයෙන් ධම්මපදට්ඨ කථාව මූලාශ්‍රයෙන් රචිත තත් කෘතියේ ඇතැම් කථා අනුකරණාත්මක ව ගළපනු ලැබුවේ මිලින්ද පඤ්ඤාය, දික්සඟි අටුවාව, සුත්ත නිපාතය ආදි ග්‍රන්ථ ද ඇසුරිනි.

සංස්කෘත කව් ලැකියට වහල් නො වූ ධර්මසේන හිමියෝ ලෙව් ලැකියෙන් පෝෂණය ලබමින් ලංකාවේ පරිසරය අනෙක් කවියන් නුදුටු විරූ අයුරින් දුටු මේ ලේඛකයා සෑම අංශයකින් ම කවිත්වය ඇත්තෙකි. පාඨ ග්‍රන්ථයේ අන්තර්ගත වස්තු ඒ අයුරින් ම හෙළ බසට නංවාලීමට වෙහෙස නොවූ තත් කවියා කථා කීමෙහි ශූරයෙකි. ඒ අනුව මේ ලිපියේ අරමුණ වන්නේ ධර්මසේන හිමියන් සතු විසිරී ගිය කෞශල්‍යය පිළිබඳ විවරණයකි.

පාලි ක්‍රමය ඉවත් කොට එහි අරුත් පමණක් ගෙන කතා රසය උද්දීප්තිමත් කරමින් භාවිත කළ රචන ශෛලිය හා භාෂා සුවිශේෂතාව කතුවරයාගේ විශිෂ්ටත්වයට නිදසුනකි. උපමාලංකාර, රූපකාලංකාර, රසවත් භාෂණ ඇසුරෙන් දේශීය පරිසරය, සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික තොරතුරු පාඨක, ශ්‍රාවක දෙපිරිසට ම සමීප කළේ සිංහල ගද්‍ය සාහිත්‍යාවලියේ සුවිශිෂ්ට ලේඛකයෙකු ලෙසිනි. එයින් උන් වහන්සේ සතු ප්‍රතිභාව කෙතරම් ද යන්න විවරණය කිරීම මෙහි අභිප්‍රාය වේ.

පර්යේෂණයේ අරමුණ

සද්ධර්මරත්නාවලියෙන් පිළිබිඹු වන ග්‍රාම්‍ය ප්‍රකෘති ජීවිතය විවරණය කළ කතුවරයා සතු ප්‍රතිභාව ඉස්මතු කිරීම මෙහි අරමුණ වේ.

පර්යේෂණ ගැටලුව

සද්ධර්මරත්නාවලිය ග්‍රාම්‍ය ප්‍රකෘති ජීවිතය කවි ලැකියෙන් සහ ලෙවි ලැකියෙන් පෝෂණ වූවක් ද?

පර්යේෂණ ක්‍රමවේදය

සද්ධර්මරත්නාවලිය පිළිබඳ ව රචනා වූ පර්යේෂණ කෘති ශාස්ත්‍රීය ලිපි, පාලි ධම්මපදට්ඨ කතාව හා සද්ධර්මරත්නාවලියට ලියවුණු සංස්කරණ පරිශීලනය කරමින් පර්යේෂණ ක්‍රමවේදය හැඩ ගස්වා ගැනිණි.

සාහිත්‍ය විමර්ශනය

1936 සහ 2005 වර්ෂවල පිළිවෙළින් සර් ඩී.බී. ජයතිලක සහ කිරුඇල්ලේ ඥාණවිමල හිමි සද්ධර්මරත්නාවලිය පිළිබඳ සංස්කරණ කර ඇති අතර උක්ත කෘතිවල ප්‍රස්තාවනාව යටතේ කර්තෘ, කාලය, සමකාලීන ලේඛකයෝ ආදි තොරතුරු කෙටියෙන් දක්වා ඇත.

1940 වසරේ මාර්ටින් වික්‍රමසිංහයන් විසින් සිංහල සාහිත්‍යයේ නැඟීම, කෘතිය යටතේ ගද්‍යය අලුත් පණක් ලැබීම මාතෘකා කරගෙන සද්ධර්මරත්නාවලියේ භාෂාව, රචන ශෛලිය ග්‍රාම්‍ය පරිසරය, කතුවරයා සතු දක්ෂතා යනුවෙන් කරුණු රාශියක් යටතේ විස්තර පෙළ ගස්වමින් කරන ලද අධ්‍යයනය රත්නාවලියේ විශිෂ්ටත්වය පෙන්නුම් කරන්නකි.

1961 ලේක්හවුස් මුද්‍රණාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද පුංචිබණ්ඩා සන්නස්ගලගේ අධ්‍යයනයක් වන සිංහල සාහිත්‍ය

වංශය කෘතියේ දඹදෙණි අවධිය හා එකල රචනා වූ කෘති අතරින් සද්ධර්මරත්නාවලිය පිළිබඳ තොරතුරු රාශියක් ඇතුළත් ග්‍රන්ථයකි.

1995 සම්භාව්‍ය සාහිත්‍යයට පිවිසුමක් අමර හේවාමද්දුම විසින් රචිත උක්ත කෘතියෙහි 7 වැනි පරිච්ඡේදය කැප කර තිබෙන්නේ සද්ධර්මරත්නාවලිය වෙනුවෙනි.

1947 මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත 'විචාර ලිපි' කෘතියෙහි සද්ධර්මරත්නාවලියේ 'ගැමියෝ' යනුවෙන් ඉදිරිපත් කළ විස්තරයෙහි ධර්මසේන හිමියෝ ග්‍රාමීය පරිසරයෙන් ලත් අත් දැකීම්, මනා පරිචයක් යටතේ භාෂාව සහ රචන ශෛලිය භාවිතයෙන් කළ අධ්‍යයනයකි.

2012 රංජිත් සේනානායක විසින් සංස්කරණය කරන ලද පී.බී. ප්‍රතිභා උවසර ශාස්ත්‍රීය සංග්‍රහය යන සඟරාවෙහි ප්‍රේමසිරි නාගසිංහයන්ගේ රචනයක් වන සද්ධර්මරත්නාවලියේ පරිවර්තන ක්‍රමෝපායයන් ලෙස උපහාසය හා හාස්‍යය මතු කිරීම ලිපිය මගින් රත්නාවලියේ විශේෂත්වය ගෙන හැර දැක්වේ.

දත්ත විශ්ලේෂණය

දහතුන් වැනි ශත වර්ෂයේ මුල් භාගයෙහි මාඝ නම් ආක්‍රමණිකයාගේ ලංකාව තරණය නිසා පොළොන්නරු රාජධානිය විනාශ මුඛයට පත් විය. එහි ප්‍රතිඵලය වූයේ ලංකාවේ අගනුවර දඹදෙණියට ගෙන යෑම යි. පණ්ඩුවංශිකයෙකු වන තෙවෙනි විජයබාහු මාඝ පාක්ෂිකයන් එලවා හැර දඹදෙණියෙහි සිය රාජධානිය පිහිටුවා ගත්තේ ය. මෙතුමාගේ රාජ්‍යය ඉතා කෙටි කලක් වූ අතර, ඔහුගෙන් පසු කාලිකාල පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා මේ රාජධානිය සමෘද්ධිමත් එකක් බවට පත් කළේ ය. (සන්නස්ගල (1967)119-120 පිටු).

පොළොන්නරුවේ නැති වී ගිය සාහිත්‍ය ව්‍යාපාරය ඇති කිරීමට මහත් පරිශ්‍රමයක් දැරූ පරාක්‍රමබාහු රජතුමා විශාල

පොත් සංඛ්‍යාවක් විවිධ විෂයයන් අළලා රචනා කරවනු ලැබුවේ උගතුන්ගේ සහ බුද්ධිමතුන්ගේ අනුග්‍රහය ලබමිණි. ජම්බුද්වීපයෙන් උගතුන් සහ පොත්පත් ගෙන්වා ගනිමින් ශාස්ත්‍රෝන්නතියට අවශ්‍ය සෑම පියවරක් ම ගනු ලැබී ය. අධ්‍යාපන ආයතන පිහිටුවීමල භික්ෂූන්ට අවශ්‍ය කරන ආරණ්‍ය සේනාසන ඇති කිරීමල බුද්ධ ශාසනය නංවාලීමල සිදු කරනු ලැබුවේ ශාස්ත්‍ර දියුණු කිරීමේ ක්‍රියා මාර්ගයක් හැටියට ය. බලවත් පරිහාණියකින් පසු ව උද්ගත වූ මේ කාලයෙහි රජ ඇමති ආදීන් ද විශේෂයෙන් පැවිදි උතුමන් ග්‍රන්ථ කරණයෙහි නියුක්ත වීම නිසා විශාල ග්‍රන්ථ සංඛ්‍යාවක් සිංහල සාහිත්‍යයට එකතු විය. එහි දී සන්න, ටීකා, ව්‍යාඛ්‍යා වියරණ, සඳැස් ආදි ග්‍රන්ථ අතර අමරණිය කාව්‍යයන් ද උසස් ආඛ්‍යාන ග්‍රන්ථයන් ද ආදි විවිධ සාහිත්‍ය කෘති ද මේ ග්‍රන්ථාවලියේ දක්නට ලැබේ. කව්සිළුමිණ, විසුද්ධිමාර්ග, සන්නය, කුදුසික සන්නය, සද්ධරමරත්නාවලිය, පූජාවලිය, කංඛාවිතරණි සන්නය, නිරුක්ති, ව්‍යඛ්‍යානය, සිදත් සඟරාව, එළුසඳැස් ලකුණ, පද සාධන සන්නය, විසුද්ධිමග්ග ටිකා, ධම්මපද පුරාණ සන්නය, සුබෝධාලංකාරය, හත්ථවනගල්ල විහාරවංශය, සමන්තකූටවර්ණනා ආදී (එම 127 - 128 පිටු) භාෂා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ රාශියක් ලිවීමෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුවත් උගතුන් භාෂා ශාස්ත්‍ර උන්නතිය සඳහා කෙතරම් පරිශ්‍රමයක් මේ යුගයේ සිදු කළේ ද යන්නත් ප්‍රචලිත ය.

උක්ත ග්‍රන්ථ සම්පාදනය කිරීමට පරිශ්‍රමයක් දැරූ උගත් ගිහි පැවිදි පඬිවරුන් අතර කීර්තිමත් වූවෝ කීප දෙනෙකි. සංඝරක්ෂිත මාහිමි, මේධංකර හිමි, අනෝමදස්සී හිමි, වාචිස්සර හිමි, සුමංගල හිමි, බුද්ධපිය හිමි, මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි, එළු සඳැස් කර්තෘ හදු හිමි ප්‍රධානත්වයක් දැරූහ. ගිහි පඬිවරුන් අතර කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා, බෝසත් විජයබාහු (එම 185-186 පිටු) කැපී පෙනේ. මේ ගිහි පැවිදි පඬිවරුන්ගේ උදාර කර්තව්‍යය හේතුවෙන් දඹදෙණි යුගය සිංහල භාෂා සාහිත්‍යයේ ස්වර්ණමය අවධිය වූවාට සැකයක් නැත.

බණ කතා ශ්‍රවණය කිරීමේ අභිරුචිය පොදු ජනයාගේ සන්තානය තුළ ඇති කරවීම හෝ ඇති වීම නිසා ධර්මයෙහි සඳහන් නොයෙක් කථාන්දර සිංහලෙන් ලියවීම ආරම්භ වූයේ පොළොන්නරු අවධියේ වූවත්, එහි දියුණු ම වකවානුව ලෙස සැලකෙන්නේ දඹදෙණි යුගය යි. මීට පෙර රචිත අමාවතුර, බුත්සරණ, දහම්සරණ යන කෘති බණ කතා විෂය කර ගෙන රචනා වුවත් එම ග්‍රන්ථ ප්‍රමාණයෙන් කුඩා විය. ඒවා රචනා කළ ඇදුරන්ගේ අරමුණු වුයේ තෙරුවන් ගුණ වර්ණනා කරමින් බුදුන් පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රද්ධාවක් ඇති කිරීම ය. අමාවතුර බුද්ධිගෝචර පාඨක පිරිසක් අරභයා රචනා වූවකි. බුත්සරණ කතුවරයාගේ අභිප්‍රාය වූයේ පොදු ජනයාගේ සිත්සතන් තුළ බුද්ධාලම්භනප්‍රීතිය ජනිත කිරීමට ය. එහෙත් දඹදෙණි යුගයේ සිංහල සාහිත්‍යයට එකතු වූ සම්භාව්‍ය ගද්‍ය කෘතියක් ලෙස සැලකෙන සද්ධර්මරත්නාවලිය රචනා වන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධා භක්තිය වැඩි දියුණු කිරීමට පමණක් නො වේ. හුදි ජනතාව කුසල් කිරීමට පොළඹවාලීමටත් ඔවුන්ට නිවන සැප අත්පත් කර දීමටත් ය.

''පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලංගනාදී වූ අඩු වැඩි ඇතත් ඒ නොසලකා පැන් හා කිරි මුසු වූවත් කිරි පමණක් තෝරා හැර ගන්නා හංසයන් මෙන් ද ශාස්ත්‍ර දන්නවුන්ගේ ජාති අඩුවුවත් උන්ගේ තරම් නොසලකා ශාස්ත්‍ර පමණක් සලකා ශාස්ත්‍ර උගන්නාවුන් මෙන් ද ප්‍රයෝජන පමණක් සිතා නුවණ නමැති ඇස්හි මෝහ නමැති පටලය වැසී අකුසල් මහවලටවැද නිවන් පුරයට ගොසින් කුසල් මහ වත නොදක්නවුන් සද්ධර්මරත්නාවලී නමැති බෙහෙදින් මෝහ නමැති පටලය නැති කොට නුවණැස අඳුරු හැර කුසල් මහවතට බැස නිවන් පුරයට සුවයෙන් යා යුතු...''(ඤාණවිමල හිමි (2005) 02 පිටුව).

බණ අසන පොදු ජනතාවගෙන් වැඩි දෙනෙකු උගත්තු නො වෙති. ඔවුනට තේරුම් ගත හැකි වන සේ ධර්ම කරුණු ඉදිරිපත් කරමින් කුසලාකුසල කර්ම පමණක් කියාපෑම උචිත

නො වන නිසා,නොයෙක් උපමා කථා මගින් ඒවා පැහැදිලි කිරීමට උත්සාහ ගෙන තිබීම සද්ධර්මරත්නාවලී කතුවරයා සතු සුවිශේෂත්වයකි. දහම් කරුණු ඉදිරිපත් කිරීමෙන් පමණක් පොදු ජනයා කුසලාකුසල මගට යොමු කිරීමට නො හැකි ය. එම දහම් කරුණු දෘෂ්ටාන්තව ශ්‍රාවකයා හමුවේ තැබීමෙන් උක්ත පරමාර්ථය ඉටු කර ගත හැකි බව විදග්ධ ලේඛකයෙකු ලෙස ධර්මසේන හිමියෝ ක්‍රියා කළේ උපක්‍රමශීලීව ය. එහි ප්‍රතිඵලය වූයේ පොදු ජනයා අතට සද්ධර්මරත්නාවලී නම් මහා ග්‍රන්ථය යොමු කිරීම ය.

"සද්ධර්මය නමැති මිණිකැට අමුණන ලද මාලය" යන අන්වර්ථ නාමය පටබැඳි මේ ග්‍රන්ථය ධම්මපදට්ඨ කථා නම් වූ පාලි අටුවාව මූලාශ්‍රයෙන් රචිත ය. මෙහි එන සුවිසි විවරණයත්, මංගල සූත්‍ර අටුවා කථාත්, නාගසේන කථා වස්තුවත්, සාගරිකා හේමවත උත්පත්ති, බරණැස් රජු ඒරකපත්ත නාගරාජ කතා ධම්මපදට්ඨ කථාවේ ඇතුළත් නො වේ. මිලින්ද පඤ්ඤාය, දික්සඟි අටුවාව, සුත්ත නිපාත අටුවාව, බුද්ධවංශ පාලිය සහ එම අටුවාව ඇසුරෙන් රචනා කිරීම තුළින් ධර්මසේන හිමියන් සතු භාෂා නිපුණතාව ද විද්‍යමාන වේ (මද්දුම (1995) 94 පිටුව).

ධර්මසේන හිමියන් ගමෙහි වාසය කරමින් ගැමි ජීවිතයේ යථාර්ථය උකහා ගනිමින් ලබා ගත් අත්දැකීම් සම්භාරය කෘතියෙන් මොනවට ප්‍රතිබිම්භනය වන අතර තත්කාලීන ඓතිහාසික තොරතුරු මගින් හෝ පැරණි ලිපි ලේඛන මගින් හෝ ප්‍රකට නො වන මුන් වහන්සේ පිළිබඳ ව ග්‍රන්ථාවසානයේ කර්තෘ නිර්දේශ පාඨයෙහි සඳහන් වන්නේ

සද්ධම්මඨිතිමිච්ඡන්තො - ධම්මසෙන යතිස්සරො
ආකාසි පවරං එතං - සද්ධර්මරත්නාවලිං
(ඤාණවිමල හිමි (2005) 1246)

සද්ධර්මයාගේ චිරස්ථිතිය කැමති වන ධර්මසේන යතිස්වර තෙමේ සද්ධර්මරත්නාවලි නම් මේ උතුම් ග්‍රන්ථය කෙළේ ය. ධර්මසේන හිමියන් දඹදෙණි යුගයේ කවර වකවානුවක ජීවත් වූයේ ද යන්න නිශ්චිත ව සොයා ගැනීමට නො හැකි වූවත්, ශ්‍රී

සංඝරක්ෂිත සංඝරාජයාණන් වහන්සේට පසු කලෙක බව තීරණය කළ හැකි සාධකයක් සුබෝධාලංකාරයේ දැක් වේ. ''ගජම්මාරෝ සමාරූළෙහා - යුද්ධායච්චන්ත මුන්තනං'' (සුබෝධාලංකාරය , 24 පිටුව) මෙතුමා ජීවත් වූයේ දඹදෙණි යුගයෙහි මුල් කොටසෙහි බවට සැකයක් නැති බව නිකාය සංග්‍රහයෙන් ද (කුමාරතුංග, 24 පිටුව) පූජාවලි කර්තෘ වන මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමියන් ධර්මසේන හිමියන්ට සමකාලීනයෙකු බව ද පිළිගැනේ.

ධර්මෝපදේශ වශයෙන් දැක්වෙන කථා වස්තු ඉදිරිපත් කරමින්, කුසල් අකුසල් හා කර්මපල විස්තර කරමින් පොදු ජනතාවගේ චිත්ත සන්තානයන්හි තෙරුවන් ගුණ හා ශ්‍රද්ධා භක්තිය මුහුකුරවා යන අයුරින් පිළියෙල කළ සද්ධර්මරත්නාවලී ග්‍රන්ථය ධම්පියා අටුවාවෙහි නො වූ සූවිසි විවරණ කථා ආදී අතිරේක විස්තර සංග්‍රහ කර තිබීම විශේෂත්වයකි. බුදු සිරිත, නාගසේන මිලිඳු වාදය, සාතාගිර හේමවත කථාව, පදුම පසේ බුදු සිරිත, මංගල සූත්‍ර විස්තර වර්ණනාව, අනාගත වංශ කථාව, සූවිසි මුනිවරයන්ගේ මව්පියන් පිළිබඳ තොරතුරු, මෙතේ බුදු සිරිත, දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා මෙතේ මුනි වරුණ ආදි බෞද්ධයෙකු විසින් අවශ්‍යයෙන් ම උගත යුතු සාරවත් ධර්ම කරුණු ද ඇතුළත් කරමින් සංග්‍රහ කරන ලද්දකි. හුදෙක් ධම්ම පදට්ඨ කථාවේ පරිවර්තනයක් නොව ඡායානුවාදයක හුරු ව ඇති ව ස්වාධීන සිංහල ධර්ම ග්‍රන්ථයක් ලෙස නිර්මිත ය. ධර්මසේන හිමියෝ මේ ග්‍රන්ථය රචනා කිරීමට මෙහෙයවනු ලැබුවේ කිසිවෙකුගේ ඇරයුමක් හෝ වෙනත් බාහිර බලපෑමක් හෝ නොමැති ව බවත්,තමන් කෙරේ පැවති හුදු කරුණාව බවත් උන්වහන්සේ ම සඳහන් කරන්නේ

"එසේ හෙයින් ඔබගේ අනුශාසනයෙහි පිහිටා තිවන් දහම් පසක් කරන්නවුන් විසින් යම්සේ වැසි ඇති කල සුභික්ෂ ද, වැසි නැති කල දුර්භික්ෂ ද එහෙයින් සුභික්ෂ දුර්භික්ෂ දෙකටම වැසි මුල් ද එසේ ම අකුසලින් දුරුව කුසල්හි පිහිටා සිත්සතන් පවිත්‍ර කරන්නවුන්ට ධර්මාභියෝගය නම් නිශ්ශරණාධ්‍යාශයෙන් බණ ඉගැන්මය .... ජාත්‍යන්ධයන්ට අන්ධ යෂ්ටිය නැතිව ගමන් බැරියා සේ,

ලක්ෂණය දැන ලක්ෂානුසාරයෙන් ඉගෙන දැන ගැනීම නුවණ මඳ වූවන්ට බැරි ය. එසේ හෙයින් යම් කෙනෙක් නුවණ මඳවත් කුසලච්ඡන්ද ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කම හැසිර නිවන් සදා ගනිත් නම්, එසේවූ සත් පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලී නම් වූ ප්‍රබන්ධයක් කරම්හ. (ඉන්ද්‍රජෝති හිමි, (1914)02 පිටුව)

මේ ප්‍රකාශයෙන් පෙනී යන්නේ උන්වහන්සේ මේ උදාර කර්තව්‍යයක මෙහෙය වූ අනික් කෙනෙක් නැත. දුක් විඳින්නා වූ හුදී ජනයන් කෙරෙහි ජනිත වූ චිත්ත චෛතසික සංකල්ප හේතුවෙන් මේ ග්‍රන්ථය රචනා කළ බව පැහැදිලි ව පෙනේ. ධර්මසේන හිමියෝ ඉන්දීය කථා වස්තු ඉදිරිපත් කළත් ඒවා ලාංකේය ජනතාවට වඩාත් සමීප වන පරිද්දෙන් ඔවුන් ජීවත්වන පරිසරය ඇසුරින් රචනා කිරීම නිසා බෞද්ධ ජනතාවට මේ කථා වඩාත් සමීප වූවා පමණක් නොව සද්ධර්මරත්නාවලිය ද අතිශයින් ජනප්‍රිය වූවාට සැකයක් නැත.

රත්නාවලිය තරම් පාඨක, ශ්‍රාවක, විචාරක අවධානය දිනා ගත් වෙනත් සම්භාව්‍ය කෘතියක් නොමැත. මෙහි එන භාෂා ශෛලිය අත්දැකීම් හා ගැමි ජීවනෝපාය පිළිබඳ උන්වහන්සේට තිබූ අවබෝධය කෙතරම් ද යන්න විචාරකයන්ගේ අදහස්වලින් ද තහවුරු වේ.

''සංස්කෘත කව් ලැකියට වහල් වූ ඇතැම් සිංහල කවීහු ලංකාවේ වටපිටාව නුදුටුවෝ වූහ. ලංකාවේ සමාජ තතු පවා සිංහල කාව්‍යයන්හි පිළිබිඹු වන්නේ ඉතා කලාතුරකිනි. ධර්මසේන හිමියෝ කව් ලැකියෙන් නොව ලෙව් ලැකියෙන් පෝෂණය ලැබූ කවීත්වය ඇත්තෝ වූහ. එහෙයින් උන් වහන්සේ සද්ධර්මරත්නාවලිය ලංකාවේ වටපිටාව හා සමාජ තතු මඳ වශයෙන් වුව ද පිළිබිඹු කරන කැටපතක් විය. (වික්‍රමසිංහ, (1963) 143 පිටුව)''

''ධර්මසේන ස්ථවිරයන් නගරයෙහි නොව පිටිසර ඉපිද පිටිසරයන් අතර ම ඇති දැඩි වූ පිටිසරයෙකු විය යුතු ය..... ඔවුන්

අගය කළ ඔවුන්ට ඇලුම් කළ ඔවුන්ගේ ව්‍යවහාරයෙන් පෝෂණය ලත් කවීත්වය ඇත්තෙකු උනැයි මම සිතමි.'' (වික්‍රමසිංහ (2008) (142 පිටුව)

''ධර්මදේශකයන්ගේ භාෂාව කථා කීමට උචිත බසක් ලෙස සකස් කරන ලද්දේ සද්ධර්මරත්නාවලියේ කර්තෘ ධර්මසේන ස්ථරවියන් විසිනි. ඔවුන් තරම් කථා කීමෙහි ශූරයෙක් පැරණි සිංහල ග්‍රන්ථාකරණයන්ගේ පරපුරෙහි නො වීය.'' (එම 124-125 පිටු)

ගැමි ආභාසය මුහුකුරා යමින් ඔවුන්ගේ ජීවන රටාවට රුචි කළ අයෙකි. ඇතැම් ගැමියෝ නාගරික පරිසරය වර්ණනා කරති. ඊට රුචිකත්වයක් දක්වති. එහෙත් ඇතැම්හු නගරයේ ජීවත් වෙමින් ගම රුචිකත්වයෙන් වණති. ධර්මසේන හිමියෝ ගමෙහි ජීවත් වෙමින් ගම ගැන ම වර්ණනා කළ යතිවරයෙකි. සද්ධරමරත්නවලියේ එන සෑම කථා පුවතකින් ම ප්‍රතිබිම්භනය වන්නේ, දක්ෂ කවියෙකු සතු ප්‍රතිභාව යි. මිනිස් ජීවිතය මැනවින් විනිවිද දුටු විශිෂ්ටතම ඤාණ සම්භාරයකින් පිරිපුන් ලේඛකයෙකි.

ධර්මසේන හිමියෝ රත්නාවලිය ලියන ලද්දේ

''නුවණ මඳවත් කුසලච්ඡන්දය නැති... නුවණ මඳවූවන්ට කුසල්වලට කැමැති''

ලිහිල් බසින්, ධර්ම කොටස් හැකිතාත් සරලව සද්ධර්මරත්නාවලිය තුළින් සම්පාදනය කළ මේ ලේඛකයා පළමු කොටසට අයත් කළේ සූවිසි විවරණ සහ සම්බුද්ධ චරිතය යි. එතැන් සිට ධම්මපදට්ඨ කථාව ඇසුරු කොට ගෙන කථා ගොඩනගා තිබේ. මෙහි කථා පිළිවෙළ දක්වා තිබෙන්නේ ධම්මපදයේ එන වග්ග සැලකිල්ලට ගෙන ඒ අනුව ය. පළමු වග්ගයට නියමිත කතා ගණන දහ හතරකි.

1. චක්ඛුපාල තෙර වත්ථු 5. කොසම්බක වත්ථු

2. මට්ටකුණ්ඩලී වත්ථු 6. චූලකාල මහාකාල වත්ථු

3. චුල්ලතිස්ස තෙර වත්ථු 7. දේවදත්ත වත්ථු

4. කාළියක්ඛනි වත්ථු 8. අග්ගසාවක වත්ථු

9. නන්දතෙර වත්ථු

ආදි පිළිවෙළට වූවත් සද්ධර්මරත්නාවලියේ කථා පිළිවෙළ මීට වඩා වෙනස් ය. චක්ඛුපාල වස්තුව, මට්ටකුණ්ඩලී වස්තුව, නාගසේන මහතෙරුන් වහන්සේගේ කථාව, චුල්ලතිස්ස තෙරුන් වහන්සේගේ කථාව, කාළි යකින්නගේ කථාව, කොසැඹෑ නුවර වහන්දෑගේ කථාව ආදි වශයෙන් කථා පිළිවෙළ දැක්වේ. ගුරුළුගෝමී අමාවතුරේ දී කථා පිළිවෙළ හැඩ ගස්වා ගත්තේ දරුණු කමෙන් අඩු තැනැත්තාගේ සිට වැඩි පුද්ගලයා දක්වා ය. එහෙත් ධර්මසේන හිමිහු අනුවර්තකයෙකු ලෙස ස්වාධීන මගක පිහිටා තිබේ. ඒ නිසා රත්නාවලී කතුවරයා හුදු පරිවර්තකයෙකු නො වේ. ධම්මපදට්ඨ කතාවෙන් කථා වස්තු බීජ කොට ගෙන මුඛ්‍යාර්ථයට ළං වෙමින් පොදු ජනතාව තුළ පහන් සංවේගය උපදවාලීමට ඔවුන් කුසල් මඟට පමුණුවාලමින් ඔවුන්ගේ බසින් ම දහම් කරුණු ඉදිරිපත් කළ යතිවරයෙකි.

"සාවත්ථියං කිර මහසුවණ්ණො නාම කුටුම්බිකො අහොසි අඩ්ඪො මහද්ධනො මහා භොගො අපුත්තකො. සො එක දිවසං නාහාන තිත්ථං ගන්ත්වා නහාත්වා අගච්ඡන්තො අන්තරාමග්ගෙ සම්පන්න සාඛාං එකං වනස්පතිං දිස්වා අයං මහෙසක්‍ය දේවතාය අදිග්ගහිතො භවිස්සතිති. තස්ස හෙට්ඨාභාගං සොධාපෙත්වා පකාරපරික්ඛේපං කරාපෙත්වා වාලිකං ඕකිරාපෙත්වා ධජපතාකං උස්සාපෙත්වා වනස්පතිං අලංකරිත්වා, පුත්තං වා ධීතරං වා ලභිත්වා තුම්හාකං මහා සක්කාරං කරිස්සාමීති පත්ථනං කත්වා පක්කාමි" (රතනසාරථෙරෙන, (1919), 2 පිටුව).

ධම්මපදට්ඨ කථාව ගුරු කොට ගත් ධර්මසේන හිමියෝ සද්ධර්මරත්නාවලියෙහි චක්ඛුපාල තෙරුන්ගේ කථා වස්තුව ආරම්භ කරන්නේ.

"එකල්හි සැවැත් නුවර මහා සම්පත් ඇති මහාසුමන නම් කෙලෙඹියාණන් කෙනෙක් වෙසෙති. සම්පත් ඇති පමණ මුත් එල ගන්නා ගස් තමා එල ගන්නා අවදියේ මුත් අතුරෙක එල නොගන්නා සේ පුත ප්‍රතිලාභයට නිසි කුසලය මූ කුරු නොගිය හෙයින් දෝ සම්පත් ප්‍රයෝජන විඳ පියන්ට නිසි දරු කෙනෙකුන් නැත. ඒ කෙලෙඹි පුත්‍රයාණෝ එක් දවසක් ගඟට ගොසින් නා පියා එන තැනැත්තෝ අතුරු මඟ අතු පතරින් ගැවසී ගත් දෙව්දුව ඉසට පැන්නගන්ට මුණින් නමාලූ ඉඳුනිල්මිනිමුවා කළයකින් වැම්මෙන ජලධාරවක් සේ සුදු කඳක් ඇති නැවත ඒ මීදෙව්දුව ඉසට කළ පිල් සතක් වැනි සෙසු ගස් කොළට උස් හෙයින් දෝහෝ නොහොත් මල් නැතිව එල ගන්නා හෙයින් වනස්පති නම් නුග ගස ආදියෙන් එක්තරා ගසක් දැක" (ඥාණවිමල හිමි (2005) 32 පිටුව).

රත්නාවලී කතුවරයා හුදු පරිවර්තකයකු නම් වචනයක් වචනයක් පාසා පාලියෙන් තිබූ වස්තුව සිංහලට පෙරළා දැක්විය යුතු ය. එහෙත් ධම්මපදට්ඨ කථාවේ වස්තු බීජ ඇසුරින් මුඛ්‍යාර්ථයට ළං වෙමින් පොදු ජනතාව තුළ ධර්මාවබෝධය ජනිත කරමින් ඔවුන්ගේ බසින් ම ධර්ම කරුණු දෘෂ්ටාන්තව දැක්වූ යතිවරයෙකි. ග්‍රාම්‍ය ජීවිතයේ පතුළට ම කිඳා බසිමින් ඔවුන්ගේ ජීවිත සත්තාව නිරූපණය කළේ ශ්‍රාවකයා ඉදිරියේ සිද්ධිය නිර්මාණාත්මකව දෘෂ්ටි පථයට ළං කරමින් ය.

ධර්මසේන හිමියන්ගේ කථා කීමේ හැකියාව විද්‍යමාන වන වැදගත් පුවතක් වන්නේ පටාචාර වහන්දෑගේ වස්තුව යි. මෙහි පෙනෙන සුවිශේෂත්වය වන්නේ අතීත අකුසල කර්මයන් දියණියට එල දුන් අයුරු සෝචනීයව දැක්වීම යි.

''තවද කළ පින් ඇත්තවුන්ගේ අවසර ලත් අකුසලයාගේ වශයෙන් වන ආපද් දක්වනු නිසා පටාචාරා වහන්දෑගේ වස්තුව කියමු.'' යනුවෙන් කථා ආරම්භය කියන්නට යන කථාව තුළ දී ම ඒ පිළිබඳ හැඟීමක් උපදව යි. මේ කථාව කියවන පාඨකයාට පෘථග්ජන මිනිසුන්ට අත්විඳිය හැකි අති භයංකාර අත්දැකීම්

සමූදායයක් කියවෙන අතර කතුවරයා පාඨක සන්තානය තුළ සංවේදී හැඟීම් ජනිත කරවන්නේ කරුණා රසයෙන් ඔවුන්ගේ හදවත් තෙත බරිත කරවමිනි.

''දරුවෝ දෙන්න සුළං ඉවසාගත නොහී හඬති. සිටුදියණියෝද දරුවන් දෙන්නා බඩතුරෙහි ලා ගෙන දෙදණත් දෙවැල මිටත් බිම ඔබලා හසුරුවාගෙන සිට තුන්යම් රාත්‍රිය ගෙවාපිය''

ස්වාභාවික පරිසරයක ඇති විපර්යාසය කතුවරයා දක්වා තිබෙන්නේ පටාචාරාවන්ගේ චිත්ත චෛතසික සංකල්පයන් සමඟ මැනවින් ගළපා ගැනීමෙන් ය.

''මෙසේ එක්ව යන කලට නොකල් නොවේලා කොටලා මහ වැස්සක් නැගීය... වස්නා වැඩි බොහෝ සේ ම ප්‍රසව දුකුත් බොහෝ විය.''

යනුවෙන් පටාචාරාවගේ ශරීරය තුළ සිදු වූ ප්‍රසව වේදනාව ශාරීරිකවිපර්යාසයත් සමඟ සම්මිශ්‍රණය කළේ චතුර කතා රචකයෙකු ලෙස ය.

පොදු ජන රුචිකත්වය උදෙසා කථා කලාවක් සම්පාදනය කළ ධර්මසේන හිමියන් ඒ සඳහා අනුගමනය කල සුවිශේෂ ලක්ෂණ කිහිපයක් වන්නේ

1. කියූ කථාවේ හරය ශ්‍රාවකයාට සිහිපත් කර දෙමින් කියන්නට යන කථාවේ හරය කෙටියෙන් පැහැදිලි කිරීම

තවද සැඳෑ ඇත්තවූනගේ සැදෑ වඩනවා....... (මට්ටකුණ්ඩලී කථාව)

2. කථාවක් අවසානයේ ඉන් ලද හැකි ප්‍රයෝජන දැක්වීම

''එසේ හෙයින් ඇමදි කසල - ඉෂ්ට විපාකය මහත් වූ නියාව සලකා කුසල්හි හැසරීමෙන් කුසලින් දුරුව සිත් සතන්

පවිත්‍ර කටයුතු'' (නාගසේන තෙරුන් වහන්සේගේ වස්තුව)

3. කථාන්තරවල සමාන අසමානතා පෙන්වමින් කථා ආරම්භය හැඩ ගස්වා ගෙන තිබීම

''චිත්ත ප්‍රසාද පමණකින් මට්ටකුණ්ඩලී ලත් සම්පත්..... බුදු වදන් නිරවුල් කළ නිසා ධර්මාභියෝගයෙහි සත් පුරුෂයන්ගේ උත්සාහය වඩනු පිණිස නාගසේන මහ තෙරුන්ගේ වස්තුව කියමු.''

මීට හාත්පසින් ම වෙනස් අයුරකින් පටාචාරා කථා වස්තුව ආරම්භ කොට ඇත. එහි දී චරිතයන්ගේ සිතැඟි සහ ඉරියව් විචාර බුද්ධියෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් යොදා ගෙන තිබේ.

ප්‍රතිභා ශක්තියේ ස්වරූපය අභිනවගුප්ත පැහැදිලි කළේ''අපූර්ව වස්තු නිර්මාණාක්‍ෂමා ප්‍රඥා ප්‍රතිභා'' (නාරම්පනාව, (2003) 18 පිටුව) පෙර නොවූ විරූ වස්තු නිර්මාණය කිරීමේ ප්‍රඥාව ප්‍රතිභාව යි. එසේ ම භට්ට තෞතගේ අදහස වූයේ ''නවනවොන්මේෂාශාලීනි ප්‍රඥා ප්‍රතිභා'' (එම 19 පිටුව) අලුත් අලුත් දේ නිපදවීමේ ප්‍රඥාව ප්‍රතිභාව යි. යන මේ ප්‍රකාශයන්ට අනුව දම් සෙනෙවිතුමන්ගේ ප්‍රතිභාව නිරූපණය වන අවස්ථා අතර පාලි කතුවරයාට වඩා ධර්මසේන හිමියෝ කථා කීමට දක්ෂයෙකි. එතුමන්ගේ බහුශ්‍රැතභාව කව් ලැකියෙන් හා ලෙව් ලැකියෙන් ද පෝෂණය වී ඇත්තේ නෛසර්ගික බුද්ධිය විශද වෙමිනි. මට්ටකුණ්ඩලී කථා වස්තුව ඇසුරෙන්, ලාංකේය පරිසරයේ සමාජ සිරිත් විරිත් පිළිබඳ තිබූ දැනුමයි.

''සාවත්ථියං කිර අදින්නපුබ්බකෝ නාම බ්‍රාහ්මණෝ තෙන කස්සචි කිඤ්චි න දින්නපුබ්බං, අහෝසි තෙන තං අදින්නපුබ්බ කෝත්වෙව සංජානිංසු, තස්සේක පුත්තකෝ අහෝසි. (රතනසාර ථෙරේන (1919) 3 පිටුව) (සැවැත්නුවර වනාහී අදින්නපුබ්බක නම් බමුණෙක් විය. ඔහු කිසිවෙකුට කිසිවක් දුන්නේ නැත. එම නිසා ඔහු අදින්නපුබ්බක නමින් හැඳින් විය. ඔහුට එකම පුතෙක් විය.)"

මූලාශ්‍රය ඇසුරෙන් කථාව ගළපා ගැනීම

''සැවැත් නුවර අදින්නපුබ්බක නම් බමුණාන කෙනෙක් වෙසෙති. ඌ තුමූ සුධාභෝජන ජාතකයෙහි කෙළ ගණන් වස්තු ඇති සිටාණන් සක් දෙවිඳුගේ උපදෙසින් දන් දීමෙහි අදහස් ඇති වන තෙක් කිසිකෙනෙකුන්ට කිසිවක් දී ලන්ට මැළියා සේ..." (මට්ටකුණ්ඩලී වස්තුව, 53 පිටුව)

ගුරුළුගෝමීන් අමාවතුර රචනයේ දී පාලි පොත්වල කථා පරිවර්තනයක් සිදු කළ ද බුත්සරණ කතුවරයා තමන්ට අභිමත අවස්ථා පමණක් මූලාශ්‍රයෙන් ගෙන කථා ගොඩනඟා තිබෙන්නේ නිර්මාණ කෞශල්‍යයෙනි. සද්ධර්මරත්නාවලී කතුවරයා පාලි ක්‍රමය ඉවත් කොට මූලාශ්‍රයෙන් උපුටාගත් කථා වස්තු තමන් අත්දුටු ජීවන ප්‍රවෘත්තීන් බහා විචිත්‍ර කරමින් වර්ණනා කළේ සංස්කෘත අලංකාර සංකල්පයෙන් තොරව ය.

"රජගෙයි වුවද ගැමියාගේ පැලෙහි වුව ද දක්නා ලැබෙන ප්‍රකෘති ජීවිත එක ය. එහෙයින් රජ මැඳුරෙහි පමණක් නොව පැල්පතෙහි ද ඔවූහු සුන්දරත්වය ක් විචිත්වයක් දුටූහ. (වික්‍රමසිංහ (2008) 128 පිටුව)''

මූලාශ්‍රයේ කතාව හා සද්ධර්මරත්නාවලියේ කථාව සසඳා බලන කල ධර්මසේන හිමිහු ස්වකීය කෘතිය සම්පාදනයේ දී වචනයක් වචනයක් පාසා හෙළ බසට පෙරළමින් කථා හැඩ ගස්වා ගෙන නැත. අනුවර්තකයෙකු ලෙසින් පාඨක ශ්‍රාවක දෙපක්ෂය වසඟ කරමින් දහම් කරුණු විවරණය කළේ ප්‍රතිභාව පිළිබිඹු වන අයුරින් ය.

එදිනෙදා සමාජ සිරිත් විරිත් විවරණය කරමින් සමාජ අත්දැකීම් පිළිබිඹු කළේ

"උන්ට බතුත් දිය යුතු ය. එසේ කලට නැතක් වී සාල් වියදම් වෙයි. නැවත කර්මාන්ත නිමවා දුන් කල මිළත් දිය යුතු ය."(මට්ටකුණ්ඩලී වස්තුව, 54 පිටුව)

ජනවහරේ යෙදුම් භාවිකයට ගෙන තිබීම

"දන්නා නොදන්නා තමාම කරන කලට වියදම් වන දෙයක් නැත්තේ වේ දැයි" (54 පිටුව)

චරිත ක්‍රියාකාරකම් මෙහෙය වන යෙදුම් පවා ලාංකේය පරිසරය ඇසුරින් ගොඩනඟා ගෙන තිබෙන්නේ අපූර්වත්වයෙනි.

"නුග ගස මහත් වුවත් නුග ඵලය කුඩා වන්නා සේ සම්පත් මහත් වුවත් අදහස තුඩා වන බැවින් '' (53 පිටුව) මේ ආදි වශයෙන් පොදු මිනිස් හැඟීම් චරිත මගින් ඉදිරිපත් කිරීම ''බොහෝ සිතුවිලි සිතා තුමුම රත්‍රන් ගෙන'' (54 පිටුව) සමකාලීනව පැවති අධ්‍යාපන ක්‍රම පිළිබඳ ප්‍රකට කිරීම ''අකුරු ලියන සේ නො දන්නා කෙනෙකුන් පොත්වල ඉරි අඳිනා සේ'' (54 පිටුව)

මට්ටකුණ්ඩලී කථා වස්තුවේ ධම්මපදට්ඨ කතුවරයා ඉදිරිපත් කරන විස්තරයට වඩා සවිස්තර ව කථා ගොනු කොට තිබෙන්නේ කාව්‍ය චින්තා පහළ කිරීමෙහි සැබෑ දක්ෂයකු පරිද්දෙනි. කුඹුරට, ගොයමට, කමතට, ගැමි පියසට,ගැමි පරිසරයට සොබා දහමට සහ තිරිසන් සතුන්ට රුචි කළ උන් වහන්සේ ගැමි වහර නො බිඳ වැකි තැනීමේ උපන් හපන්කම් ඇත්තෙකි. තැනට සුදුසු උපමා අදහස් මතු කරනු ලැබුවේ ඉන්දියානු පරිසරයෙන් නොව ලංකානු පරිසරයෙනි. කාළියක්ඛිනියගේ කතා වස්තුවෙහි දක්වා තිබෙන නැන්දම්මා සහ ලේලිය අතර ගැටුම මෙරට ජන සමාජයට ඉතා දැඩි ලෙස බලපෑ කථාන්තරයකි.තමන්ගේ පුත්‍රයාට වුවත් බිරිඳක ගෙන්වා දීමේ අරමුණ ධර්මසේන හිමියන් පැහැදිලි කළ ආකාරය එදා අතීත කාලයට සීමා වූ සිද්ධියක් හැටියට සැලකීමට වඩා වර්තමානයට ද බලපාන ආකාරයට අරමුණු පැහැදිලි කොට තිබෙන්නේ තුන්කල් දකිමින් ය.

"මුන්ට සරණක් ගෙනවුත් පාවාදීලිම් නම් මුන්ට සැතපිලිත් ඇත.මමත් මුන්ගෙන් ප්‍රයෝජන විඳිනා ලෙසට මුන්ගේ සුවදුක් දන්නා නම් වෙමි''(කාලියකින්නගේ කථාව).

විවාහයක් කර දීමට දෙමාපියන් සූදානම් වූ අවස්ථාවේ ඊට පුතා විරුද්ධ වෙයි. එහෙත් පුතා රුචි කරන බිරිඳ ගෙනවිත් දීමට දෙමව්පියෝ සාකච්ඡා කරති. වර්තමානයේ තරුණයෙකුට වුව ද තමන්ගේ අභිමතය පරිදි විවාහයක් කර ගැනීමට ඇති කැමැත්ත ගැන හැඟීමක් ඇති කර ගත හැකි ය. ඒ සම්ප්‍රදාය අතීතයට පමණක් නො ව වර්තමානයට ද එක සේ බලපෑ සංකල්පයකි.

කුස ජාතක කථාවේදී කුස කුමරුට විවාහයක් කර ගැනීමට මාපියෝ ඉල්ලා සිටි අවස්ථාවේ ඊට කුමරු අකමැත්ත පළ කරති. එහෙත් දෙමාපියන්ගේ ඇවිටිලි නිසා කුස රන් පිළිමයක් සකස් කොට ඊට සමාන කාන්තාවක් ලැබුනහොත් විවාහ වන බව පවසන්නේ තම සිතේ පැවති අභිමතයට අනුව විවාහ සංස්කෘතියට ඇතුළත් වන බව අභිරුචියෙන් යුතු ව යථාර්ථවත්ව දක්වමිනි.

දම්සෙනෙවිතුමෝ නාගසේන වස්තුව මූලාශ්‍රය කර ගත්තේ ''මිලින්ද පඤ්ඤාය'' නමැති පාලි ග්‍රන්ථයේ බාහිර කථා වස්තුව යි. නාගසේන කතා වස්තුවේ එන නාගසේන සහ මිලිඳු රජු පිළිබඳ සංවාදය මගින් චරිතයන්ගේ හැසිරීම් රටාව, ඔවුන්ගේ අදහස් ඒ හා බැඳුණු චර්යාමය පද්ධතිය විවරණය කරන්නේ නූතන නවකතා, කෙටි කතාකරුවෙකුගේ චරිත නිර්මාණය කිරීමේ කුසලතාව ඔප් නැංවෙන පරිද්දෙනි.

පාලි ධම්මපදට්ඨ කථාව ගුරු කොට ගෙන ථුල්ලතිස්ස තෙරුන්ගේ කථාව නිර්මාණය කර තිබෙන්නේ මහලු වයසට පැමිණි භික්ෂුවකගේ චරිත ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමිනි.

"මහල්ලක කාලෙ පබ්බජිතො බුද්ධානං උප්පන්නං ලාභසත්කාරං පරිභුඤ්ජන්තො ථුල්ලසරීරො අකෝට්ත පච්චාකොටිතේහි චීවරෙහි..." (රතනසාර ථෙරෙන, 1919, 20 පිටුව)

මහලු කල පැවිදි වූයේ බුදුන්ට උපන් ලාභ සත්කාර අනුභව කරමින් මහත්වූ ශරීර ඇතිව ය. ධර්මධර ,විනයධර භික්ෂූන් දෙනමක් අතර ඇති වූ කලහයක් වස්තු බීජ කර ගෙන කෝසම්බිය කථාව ගොඩනඟා ඇත. මේ අනුව ධර්ම සේන හිමියන්

කථා වස්තු රචනා කිරීමේදී ඒ සඳහා වස්තු බීජ තෝරා ගත්තේ ධම්පදට්ඨ කථාවෙන් වුව ද ලංකාව හා සම්බන්ධ කථාන්තර එම කථාවලින් බොහෝ දුරට පැනෙයි. භාරතීය ජන සමාජයේ අන්තර්ගත තොරතුරුවලට වඩා ලාංකේය ජන ජීවිතය හා ගැටුණු ලේඛකයකු වන ධර්මසේන හිමියෝ ලාංකේය රජවරු රාජකීය වෙනත් පුද්ගලයන් සාමාන්‍ය ජනතාවගේ ජීවනෝපායයන්, වැඩි වශයෙන් ගම්බද ජනතාව, ආදී වශයෙන් දක්වා තිබෙන්නේ සමකාලීන සමාජ තොරතුරු විවරණය කරමින් ය. විශාඛා වස්තුවෙහි ලාංකේය පැරණි සමාජයේ අධිකාරම්වරුන් පිළිබඳ

"ලංකා අධිකාර දෙමළ අධිකාර මුදල් පත් ආදී වූ ඒ ඒ දෙනාට කවර කවර ගෙවල් නිල කරමෝදැයි" විචාළ බව (විශාඛා වස්තුව, 394 පිටුව) සඳහන් වෙයි. එහි ම

"විසාකාවන් සැවැත්නුවරට යන්ට රථයට නැගි කලට සාකේත නුවර තමන් සන්තක මහතින් ලක්දිව අනුරාධපුර නුවර සා බත්ගම් තුදුසේ හිදිනා" (එම 396 පිටුව) කියැවෙයි. මිහින්තලාවේ විසූ තිස්ස නම් තෙර කෙනෙකුගේ කථා පුවතක් සිරිමා වස්තුවෙහි දැක්වේ.

"සියල් සිරුර ඇට සැකිල්ලක් කොට සිතා අට්ඨික භාවනා කොට රහත් වූ මමින්තෙලෙහි තිස්ස තෙරුන් වහන්සේ මෙන්" (සිරිමා වස්තුව, 732 පිටුව) මේ තොරතුරු පාලි අට්ඨ කථාවෙහි නො එයි.

"සිංහල සම්භාව්‍ය සාහිත්‍යය ලංකාව හා සම්බන්ධ කථාන්තර ඇතුළත් කරන ලද කෘති අතර සද්ධර්මරත්නාවලියට මූලික තැනක් හිමි වේ. අමාවතුර, බුත්සරණ පූජාවලිය, ථූපවංශය යන කෘති සමග සසඳන කල ඒවායෙහි බෙහෙවින් ම දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි. ඒ අතර පූජාවලියේ තිස් දෙ වන පරිච්ඡේදයෙන් පසුවත් ථූපවංශයේ දුටුගැමුණු පුවත හා සම්බන්ධ තොරතුරු ලංකාව සම්බන්ධව ගෙන එයි. විශේෂයෙන් ම සාසන ඉතිහාසය සම්බන්ධ කථාන්තර වේ. එහෙත් ධර්මසේන හිමියන් සෑම කථා පුවතක් ම ඉදිරිපත් කොට තිබෙන්නේ ලංකාව හා

සම්බන්ධ තොරතුරු ඇතුළත් කරමින් ය. සූකර පෝතිකාවගේ වස්තුවේ ලංකාවේ අනුරාධපුර නුවර හා රුහුණු රට දීගාමඩුල්ල ගැන තොරතුරු දැක්වේ.

"එකල දුටුගැමුණු රජ්ජුරුවන්ගේ ලකුණ්ටක අතිම්බරු නම් ඇමත්තේ කිසි කටයුත්තක් සඳහා ඒ ඒ ගමට ගියේ සුමනා නම් කුමාරිකාවක් දැක ඇය කෙරෙහි ඇලුම් කොට ඇතිව මගුල් කොට සරණපාවා ගෙණ මහා පුණ්ණ නම් ගමට ගියේ ය. එකල කෙළපවු වෙහෙර වැසි මහ අනුල නම් තෙරුන් වහන්සේ ඒ ගමට සිගා වැඩි සේක්. සුමනා නම් කුමාරිකාව දැක (සූකර පෝතිකාවගේ වස්තුව, 1016 පිටුව)

සත් දෙවිඳුහුගේ වස්තුවෙහි ලංකාවේ ලෝවාමහා ප්‍රසාදය සහ මහා විහාරය ගැන තවත් කථානන්තරයකි."

''මහා විහාර වැනි ලක්‍ෂ ගණන් විහාර කරවා දන් දුන් නමුත් ලෝවාමහාපාය වැනි ලක්‍ෂ ගණන් ප්‍රාසාද කරවා'' (සක්දෙව් වස්තුව, 866 පිටුව)

ලාංකේයන්ගේ ප්‍රධාන ජීවනෝපායන මාර්ගයක් වන වී ගොවිතැන පිළිබද ධර්මසේන හිමියන් නොයෙකුත් තැන්වල විවිධ කියමන් ඉදිරිපත් කොට තිබේ. දේවදත්ත වස්තුවෙහි ලංකාවේ ගොවිතැන පිළිබඳ කෙරෙන විස්තරයෙන් කෘෂිකර්මාන්තය ගැන උන්වහන්සේට තිබූ අවබෝධය ප්‍රත්‍යක්‍ෂ වේ.

''පළමු කොට කුඹුරු ගෙවඩිය යුතුය. ඉක්බිති බිම් නැගිය යුතුය. පසු ව දෙසීසෑව යුතුය. නියර කෙටිය යුතුය. පින් සී සාන්නට යුතු ය. කැට තලා පෝරු ගෑ යුතු ය. කළල ලැමු කට යුතුය. ඉස්නන් තෙමිය යුතු ය. දිය බැන්ද යුතු ය. රෝග යටරා කෙම් කළ යුතු ය. ගොයම් පැසී ගිය කලට දාමැඩ වී අටු කොටුවල ලිය යුතු ය. පෙරළා ඉපනැලි සෑව යුතු ය. වල් පැල කෙටිය යුතු ය. දවා හෙළිකළ යුතු ය. විපුල යුතු ය. මාසේ සමසත් මෙලෙසම කට යුතු ය.'' (ඉන්ද්‍රජෝති හිමි, දේවදත්ත වස්තුව, 151 පිටුව)

ගොවිතැන එදා ලක්දිව පැවති ගොවි සමාජය පිළිබිඹු කරන්නක් හැටියට අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් ධර්මසේන හිමියන් ගොවියා හා ගොවිතැන දෙස බැලූයේ ගැමි සම්පත හා ගොවිතැන බඳු නිදහස් රැකියාවක ඇති මිහිරියාව පාඨකයන් හමුවේ තබමිනි. නාගසේන කථා වස්තුවෙහි මිලිඳු රජු වාදයට සුදුසු පුද්ගලයන් ඉදිරිපත් කරන ඇමැත්තන්ගේ කියුම් ලෙසින් ගැනෙන යට වාක්‍යය ද

"එසේ විචාළ රජ්ජුරුවන්ට ඇමැත්තෝ සිංහලයන්ගේ ස්වරූප විචාළ කෙනෙකුට තිරිසන් යෝනීන් හා සිව්පා ලෙසින් සරිකොට සිතා ගෙන කැණවිලූන්ගේ ස්වරූප කියන්නවුන් මෙන්" (නාගසේන වස්තුව, 68 පිටුව)

නාගසේන වස්තුවේ ඇතුළත් නාගසේන තෙරුන් වහන්සේගේ ප්‍රකරණ සත සත් මසකින් සම්පූර්ණ කළ අයුරු ධර්මසේන හිමියෝ කෞශල්‍යයෙන් යුක්තව ප්‍රකාශ කළේ

''නුවණ නැමැති තුඩින් සිත් නැමැති උගුර තෙමා එක් විට බීජු විජම් නැමැති පැන් නොමඳ නියාව හඟවන්නට සත් මසෙකින් වමාරා නිමවූ සේක'' (නාගසේන වස්තුව...)

ජුගුප්සා රසය ජනනය වන පරිද්දෙන් ශරීර ස්වභාවය පැහැදිලි කළේ ප්‍රකෘති පීඩිත තත්ත්වය නිරූපණය කරමින් ය. ''පිටින් කසා ගා තෙල් ගා පිරිමැසූ බඩ ඇතුළේ තුබූ කුණු රාශියක් බලව'' (අගසව් වත...)

පාලි කථාව හා සද්ධර්මරත්නාවලිය කථාව සංසන්දනය කර බලන කල ධර්මසේනහිමියන් ස්වකීය කථා ගොඩනඟා ගෙන තිබෙන්නේ පරිවර්තනයක් හැටියට නොව අනුවර්තකනයක් ලෙසිනි.

" ඔබ ... වැළිත් ගොයම් කළ මනා වක තබා කල් පසුකොට කරන ගොයමක් සේ පිළිවෙත් පිරීමට යෝග්‍ය වූ බාලආවස්ථාවෙහි ගිහිගෙයි ම රඳා ...වැඩි මාලු කල මහණ ව

රූක්‍ෂ ප්‍රතිපත්ති නැමැති....''(ඤාණවිමල හිමි (2005) 93 පිටුව)

මෙහි දී ධර්මසේන හිමියන්ට ගැමි ජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තිය වන ගොවිතැන පිළිබඳ ව තිබූ අවබෝධය පසක් වේ.

චූල්ලතිස්ස තෙරුන්ගේ අභ්‍යන්තර සිත තුළ තිබූ අහංකාරකම පැහැදිලි කළේ චිත්ත චෛතසික ස්වභාවයන් වෙනස් වන අයුරු පාඨකයාට අවබෝධ කර දෙමින් ය.

"පිළිවෙතින් සිහින් වුවත් මසින් ලෙයින් මහත්ව ඉසත් බඩත් මහත් සෙයින් ..." (93 පිටුව)

මුලින් උපහාසය ගොඩනඟා පසු ව එය අනුකම්පාවකට පෙරලුයේ පාඨකයා තුළ හාස්‍ය ඉස්මතු කොට අනතුරු ව අදාළ චරිතය කෙරෙහි සානුකම්පිත දෘෂ්ටියක් ඇති කරවමින් ය.

එසේ විචාළ කලට බසක් කියාලුවොත් බාල නියාව කියාලන ව්‍යාවහාර ලෙසින් හැඟෙති යි බැණ නො නැඟෙන සේක (එම 94 පිටුව)

මූලාශ්‍රයේ නො දැක්වෙන තොරතුරු රැසක් එක් රැස් කරමින් චුන්ද නම් ඌරු වැද්දාගේ කථාව ගොඩනැගුවේ ඌරු වැද්දා කෙරෙහි දයානුකම්පාවක් ඇති කරමින් ය.

"යම් යම් හූරෙකු මරා කනු කැමැත්තේ වී නම් ඒ හුරා තරකොට කණුවක නොසැලෙන ලෙස බැඳ සිටුවාලා මස් බොල්වනු නිසාත් පව් බොල් වනු නිසාත් සිව් රැස් මුගුරකින් තළා මස් බොල් වූ නියාව මුත් පව් බොල් වූ නියාව නොදැන...(චුන්දනම් හුරු වැද්දාගේ වස්තුව, 168 පිටුව)

මූලාශ්‍රයේ නොමැති අයුරින් කථා ගොඩගසා ගැනීමේ දී භාවිතයට ගත් උපමා කථා රසය උද්දීප්තිමත් කරන්නට බෙහෙවින් හේතු වෙයි. ඒහි දී සාම්ප්‍රදායික උපමා, කතුවරයා විසින් ම ගෙඩනඟා ගත්තේ පද්‍ය රචකයෙකුගේ නිර්මාණශීලිත්වය

විද්‍යමාන වන අයුරින් ය. සිංහල ගද්‍ය සාහිත්‍යයේ උපමා කෞශල්‍යය පිළිබඳ විද්‍යාචක්‍රවර්තීට හිමි වූයේ විශිෂ්ට තැනෙකි. ඊට නො දෙ වෙනි අයුරින් ගැමි ජීවිතයේ සෞන්දර්යාත්මක ස්ථානයන්ට ස්වකීය නුවණැස යොදමින් නිර්මාණය කළ උපමා ප්‍රතිභාපූර්ණ කවිත්වයට තෝ තැන්නෙකි.

''අනික් සිංහල ගද්‍ය ග්‍රන්ථකාරයෝ පොතින් උපුටා ගත් කථා වස්තු පොතින් ම උපුටාගත් උපමා උපමේය ආදියෙන් සංකලනයෙන් වර්ණනා කළහ. ධර්මසේන හිමියෝ පොතින් උපුටාගත් කථා වස්තු තමන් අත් දුටු ජීවන ප්‍රවෘත්තීන් බහා විචිත්‍ර කරමින් වර්ණනා කළහ.'' (වික්‍රමසිංහ (2008) 128 පිටුව)

එම උපමා වර්ගීකරණයට ලක් කළහොත්, සත්ව ලෝකයෙන් ගන්නා උපමා "සුවදෙහි හුන් මැස්සන් කිසි කලෙක අමධ්‍යයෙහි හිඳී නා සේ." සමකාලීන සමාජ ජීවිතයෙන් ගන්නා ලද උපමා "පය බරවායට පිටි කර බෙහෙත් බඳිනා සේ'' (55 පිටුව) "ආඳා යවා තබා වල්පත ගත්තා සේ'' (55 පිටුව) ''හී දඬු මිටියකින් හී දණ්ඩක් හයා ගත් කලට එහි අඩුව පෙනෙන්නා සේ'' (54 පිටුව) විවිධ වෘත්තීන් සම්බන්ධ උපමා " මැණික් තිබියදී බොරළු අවුලන්නා සේ". "පැලය නැගී මූකුරණ කලට බිජුවට ඇට දිරා නැති වන්නා සේ'' "අත්දුටු බෙහෙත් තිබියදී ඔබ්බේ බෙහෙත් විචාරන්නා සේ.'' (55 පිටුව) ජන වහරින් ගත උපමා "අනුන් දමා ලූ දෙයක් හැර ගන්නා සේ." සමකාලීන සමාජයේ පවත්වනා සාරධර්ම ඇසුරෙන් නිපදවා ගත් උපමා. ''ජීවිතයේ යථාර්ථවත් බව පිළිබිඹු වන උපමා ''සසර බැඳ රඳවන්නට හිඳුවාලූ කණුවක් සේ'' "කිරි බොන දරුවන් මැණියන්, අවු කලට කිරට ඒලෙන්නා සේ'' " බහෙත් සාදා විඳ විඳ සිටිය වුන්ට බූලත් දෙවා සාදය නිමවන්නා සේ" යනුවෙන් ධර්මසේන හිමියන් පිටිසර ගමක වෙසෙමින් එහි ජීවන අත්දැකීම් ලබමින් නිපදවාගත් මේ උපමා සද්ධර්මරත්නාවලිය පුරාම විසිරී පවතී. එයින් උන් වහන්සේ සතු ග්‍රාමීය සමාජය පිළිබඳ අවබෝධය කෙතරම් ද යන්න පාඨකයාට පසක් වේ.

ස්වාමි නිවාපත් දත්වා යාති. ආහාරං තෙ පචිස්සාමීති වත්තං" (ධම්මපට්ඨ කථාව) (ස්වාමීනි උයන්න දෙයක් දී යන්න. ආහාර වේලක් ඔබ සඳහා පිළියෙල කරමි.) මේ පාඨය ඇසුරුකරගෙන සද්ධර්ම රත්නාවලියේ දැක්වෙන්නේ, "සා සුඟක් දුන මැනවි. නිකම් හිඳීනා ගමනේ දවාලට බතක් නිසා බත්පිසීමපිට ලාලා එදවස රඳවන්ට සිතූහ." යනුවෙන් සිතක් තුළ පහල වන චිත්ත චෛතසික ධර්මයන් අවබෝධ කර ගැනීමට ද සද්ධර්මරත්නාවලියේ කථා මහෝපකාරී වේ.

පටාචාරා වස්තුව ගත් විට ඉතාමත් රසවත්, හැඟීම් උත්සන්න වන වස්තුවකි. එනිසා ඇතැමුන්ගේ ප්‍රශංසාවට ලක් වූයේ

''ඔවුන්ගේ භාෂාව ග්‍රන්ථ ඥාණයෙන් සුබාශිත බුද්ධිය ඇති පඬිවරයන් ප්‍රිය නොකළ ගැමියන්ගේ වදනින් ද ව්‍යවහාරයෙන් ද පෝෂිත වීමෙන් අපූරු ස්වෛරීත්වයකින් හා රසභාවයකින් ද සිත් අදිනුයේ නිසැකවම ඔවුන් ගමෙහි ඉපිද දියඋරන්නා කඩමාල්ලක් සේ ගැමියන්ගේ ව්‍යවහාරයෙන් ලැබූ පෝෂණයෙන් වැඩුණු කවීත්වය ඇත්තෙකු වූ බැවිනි. (වික්‍රමසිංහ (2015), 07 පිටුව)

භාෂාව යොදා ගැනීමේ දී කතුවරයා අවස්ථෝචිත හැඟීම් දනවන පරිද්දෙන් භාවිතයට ගෙන තිබීම මූලාශ්‍රයට වඩා කැපී පෙනේ. පටාචාරා මුහුණ දුන් අතිශය දුක්බර අවස්ථාව පාඨක සන්තානය තුළ සංවේදීතාව ජනනය කළේ හද කම්පා වෙන අයුරින් ය. ඇතැම් විචාරකයන් පටාචාරා වස්තුව ගැන සඳහන් කළේ අනික් සිංහල කවීන් ග්‍රන්ථාරූඪ කළ පටාචාරා වස්තුව හා සද්ධර්මරත්නාවලියෙහි පටාචාරා වස්තුව හා සැසඳීමෙන් ධර්මසේන හිමියන්ගේ කවිත්වයෙහි ඒ උත්තමාංගය දත හැකි කථා වස්තුවක් හැටියට යි. (වික්‍රමසිංහ (2008) 129 පිටුව)

"මෙසේ එක්ව යන කලට කොකල්, නොවේලා කොටලා මහ වැස්සක් නැගීය..." "අහස ගුගුරන්නා සේ හඬ ගසන්ටත් වන වස්නා වැසි බොහෝ සේ ප්‍රසව දුකුත් බොහෝ විය.

(පටාචාරා වස්තුව, 635 පිටුව) ඒ මොහොතේ ඇති වූ පාරිසරික විපර්යාසය පටාචාරගේ, දුක වේදනාව වහින වැස්සෙන්සංකේතවත් කර තිබෙන්නේ ශ්‍රාවක පාඨක දෙපාර්ශ්වයේ ම සානුකම්පිත දෘෂ්ටිය ජනිත වන පරිද්දෙනි. මූලාශ්‍රයේ නො දක්නා තොරතුරු රැසක් එක් රැස්කරමින් චුන්ද නම් ඌරු වැද්දාගේ කථාව ගොඩනැගුවේ ය.

"යම් ඌරෙකු මරා කනු කැමති වී නම් ඒ ඌරා තරකොට කණුවක නොසැලෙන ලෙස බැඳ සිටුවාලා මස් බොල්වනු නිසාත් පව් බොල් වනු නිසාත්..." (168 පිටුව)

මෙහි දී ඌරා කෙරෙහි පමණක් නොව වැද්දා කෙරෙහි ද අනුකම්පාව ජනිත කොට තිබීම. ධර්මසේන හිමිහුගේ කතා කලාවේ සුවිශේෂයක් ලෙස ගම්‍ය වන අතර උන්වහන්සේගේ හදවත තුළ ජනිත වූ සානුකම්පිත දෘෂ්ටය කෙතරම් ද යන්න ගම්‍ය වේ.

එ සේම චුන්ද නම් ඌරු වැද්දාගේ කථාව අසන්නාට පැහැදිලි ව අනාගතයේ ඔහු විඳින විපාකය ගැන ද අවබෝධයක් ලබාදෙන්නේ කුසලාකුෂල කර්ම විපාක දෘෂ්ටාන්තව දක්වමිනි.

" කට ලෝදිය වත් කරන ලෙසට ඌගේ තටත් සැන්දකින් තරව කකියා ගිය හුණු පැන් වත් කෙරෙයි." (168 පිටුව)

මෙහි දී අවීචියෙහි කට හැර ලෝදිය වත් කරන අයුරු ක්‍රියාව විස්තර කරන ගමන් ම විපාකය පිළිබඳ අවබෝධයක් ලබාදීම, චරිතය ගැන අනුකම්පාවක් ඇති කිරීම, අසන්නා පවින් වළක්වාලීම. මූලාශ්‍රයේ නොමැති අයුරින් කථා ගොඩනඟා ගැනීමේ දී භාවිතයට ගත් උපමා, කථා රසය උද්දීප්තිමත් කරන්නට බෙහෙවින් හේතු වෙයි. ඒහිදී සාම්ප්‍රදායික උපමා, කතුවරයා විසින් ම ගෙඩනඟා ගත්තේ ගද්‍ය රචකයෙකුගේ නිර්මාණශීලිත්වය විද්‍යමාන වන අයුරින් ය.

''කවියෙකුගේ උසස් රචනාවට වස්තු වන්නේ මානව ජීවිතයෙහි ගැඹුරු පදය ජීවිතයෙහි සුලභ බොල් දේ දහයියා

මෙන් පොළා හැර හර ඇති දේ තෝරා ගනු පිණිස ඔහුට උපකාර වන්නේ විශාරද දැනුම, වැටහෙන නුවණ හා විචාර බුද්ධිය යන තුනයි.'' (වික්‍රමසිංහ (2006) 49 පිටුව)

මේ අනුව ගැඹුරු හෝ නො ගැඹුරු කරුණු ඉතා පහසුවෙන් පාඨයන්ගේ සිතට ගෝචර වන අයුරින් භාවිතයට ගත හැකි එක් උපක්‍රමයක් වන්නේ රූපකාලංකාර භාවිතය යි. පාලි අටුවාවෙහි සමහර තැනෙක රූපක යොදා ඇති අතර එබඳු තැන් වඩාත් සෝභාවත් කරමින් වර්ණිත අවස්ථා අර්ථාවබෝධයට සමීපවත් කළේ විශිෂ්ට ප්‍රතිභාව ලත් කවියෙකු ලෙස ය.

''මේ ගඟ රළ දිවෙන්නා සේ මාගේත් නුවණ නැමැති ගඟින් ප්‍රශ්න නැමැති බොහෝ රළ නිම්මයක් නැතිව මතට නැමැති ගඟබඩට දිවෙයි'' (නාගසේන වස්තුව)

''වාද නැමැති පවනින් සොලවාලිය නො හැකි නුවණ නැමැති මහමෙර ඇතිව'' (නාගසේන වස්තුව...)

''මෙත් නැමැති දිය කවා මොළොක් කළ සිත් නැමැති කුඹුරු(කාලියකින්නගේ වස්තුව, 107)

''ගුණ ධර්ම නැමැති බිජුවටින් ලොවී ලොව්තුරා සැපැත් නැමැති වී සම්පත් සාධා දී ලයි. (එම 107)

ගද්‍ය හෝ පද්‍ය රචකයෙකුගේ නිර්මාණාත්මක රචනා ශෛලිය හා භාෂා සම්ප්‍රදාය කෙරෙහි පාඨකයා දක්වන රුචිකත්වයෙන් ඔහු සතු කෞශල්‍යය පිළිබිඹු වනු ඇත. එමෙන් ම තත් කතුවරයාගේ ජනප්‍රියත්වයට ද හේතුවක් වනු නිසැක ය. දඹදෙණි යුගයේ බණ කථා සාහිත්‍ය රචකයන් අතර දම්සෙනෙවිතුමෝ ප්‍රමුඛස්ථානයක් ගනු ලබන්නේ උන් වහන්සේ තත් කෘතිය රචනා කිරීමේ දී අනුගමනය කළ බස්වහර හා රචන සම්ප්‍රදාය හේතුවෙනි. සරල, අවධාරණ හා භාවාත්මක යනුවෙන් ත්‍රිවිධාකාරයෙන් යුක්ත රචන විශේෂයක් වශයෙන් ප්‍රකට වන අතර ප්‍රස්තා පිරුළු, උපමා, රූපක, ඉඟිවැකි, උපහැරණ කථා,

උපහාස ආදිය ප්‍රකටව දක්නට ලැබීම විශේෂත්වයකි. පන්සිය පනස් ජාතක කථා හා පූජාවලියේ කථාන්දර සමඟ සසඳන කල රත්නාවලී පාඨකයා වෙහෙසට පත් කරන සංකීර්ණ දීර්ඝ වාක්‍ය දක්නට නොමැත. දේශනා ග්‍රන්ථ විලාශය අනුකරණය කරමින් ධර්මසේන හිමියෝ ද ස්වකීය ග්‍රන්ථ ශෛලිය හැඩ ගස්වා ගත්තේ පොදු ජන පාඨකයාට සිත් වූ පරිද්දෙනි.

ධර්මසේන හිමිහුගේ භාෂාව ලිහිල් ය. එසේ වුවත් වාග් රසයෙන් අනූන ය. සද්ධර්මරත්නාවලිය අසන, කියවන කාගේ වුවත් චිත්ත ප්‍රබෝධයක් ඇති වනු නො අනුමාන ය. එනිසා ම සිංහල ගද්‍ය සාහිත්‍යයේ මුදුන් මුල ලෙස සද්ධර්මරත්නාවලිය අවිවාදයෙන් පිළිගැනේ.

''පාලි සාහිත්‍ය කෘතීන්හි කථා හැකිතාක් කෙටියෙන් දැක්වූව ද සංස්කෘත අලංකාරයෙන් තොරව ගැමියන්ගේ වාග් ව්‍යවහාරයට සමීප වෙමින් ධර්ම දේශකයන්ගේ භාෂාව අපූර්ව විලාශයකට පත් කර ගත් දම්සෙනෙවිතුමෝ ස්වතන්ත්‍ර භාෂා රීතියක් ගොඩනඟා ගැනීමට උත්සුක වූ ලේඛකයෙකි'' (වික්‍රමසිංහ, සිංහල සාහිත්‍යයේ නැගීම, 140 පිටුව).

නිර්මාණාලාප බිණීමෙහි සහජ දක්ෂතාවක් තිබූ ධර්මසේන හිමියන් සාහිත්‍යමය අගය දියුණු කරවන ව්‍යාජස්තුති ධ්වනි හා සූත්නි භාවිත කළේ ග්‍රාම්‍යත්වයෙන් තොරව හාස්‍ය රසය ජනිත වන පරිද්දෙනි. මේ තුළින් උන්වහන්සේ සතු දුර්ලභ කවිත්වය ප්‍රකට කෙරේ. ගුරුළුගෝමී වැනි විදග්ධ ලේඛකයන්ගේ සිනා රසය, කැකුළු වදනින් හා විරෝධාභාසයෙන් නැගුණත් ධර්මසේන හිමින් සිනා රසයෙන් පමණක් නොව දයාවෙන් ද තෙත්ව ගිය ඇනුම් පදයෙන් සරසා ලූයේ කෞශල්‍යය නිරූපණය කරමින් ය.

''දෙකොළින් කුණු කෙළත් වැගිරෙයි. බවා පලවන්නට ම කරන්නා සේ නාසයත් හඬවයි. නිදන හෙයින් ඇස් වී තිබෙතත් කටත් දැල්වී තිබෙයි.'' (චිත්ත හත්ථ පෙරවත)

''චූකාළයන්ගේ අඩු දෙන්නක කළයුත්තේ අඹුවො අපායවල ගණනෙ සතර දෙනෙක....''(මහා කාළවත)

''කතාවෙහි ප්‍රයෝජන පමණක් සලකා කන්නට එන බල්ලෙකුට අසුර ගසා සාද කරවන්නා සේ'' (නාගසේන වත)

''කැණවිලි බල්ලන් සිංහනාද කරන්නට සිතින් කැණවිලි හඬම හඬන්නා සේ'' (නාගසේන වත)

''බුදුනට උපන් මියුරු ආහාර සුවසේ වළඳා පිළිවෙතින් සිත් ළවුවත් මසින් ලෙයින් මහත්ව ඉසත් බඩත් මහත් හෙයින් චුල්ලතිස්ස තෙරුන් වහන්සේ යයි ප්‍රසිද්ධ ව....'' (චුල්ලතිස්ස වත)

මෙවැනි උපහාසාත්මක ප්‍රකාශ මගින් නැංවෙන හාස්‍ය රසය අදාළ චරිතය කෙරෙහි කිසිවිටෙක කෝපයක් ක්‍රෝධයත් ඇති නො කොට දයාවෙන් තෙත්ව ගිය සානුකම්පිත ස්වරූපයක් ජනිත කළේ ශක්‍යතාවෙනි.

සිංහල ගද්‍ය සාහිත්‍යාවලියේ සුවිශේෂී ග්‍රන්ථයක් වන සද්ධර්මරත්නාවලියට වස්තු බීජ වූයේ ඉන්දීය කථා ය. එහෙත් ලාංකේය පරිසරය සම්මිශ්‍රණයෙන් සෑම කථාවක් ම ගළපා ගත්තේ ග්‍රාම්‍ය ජන ජීවිතයේ පතුළට ම කිඳා බසිමින් ය. වික්‍රමසිංහයන්ගේ අදහස වූයේ

''පාලි කථා විවේක බුද්ධියෙන් තොර ව සිංහලයට නඟා ග්‍රන්ථාරූඪ කිරීම නිසා සද්ධර්මරත්නාවලිය මහා මූකළානයක් වැනි ගද්‍යයක් විය. ධර්මසේන ස්ථවිරයන්ගේ සුන්දර සුලලිත රීතිය ද ගැමි ජීවිතය නැමැති විසිතුරු සායම් බඳුනෙහි බහා ගත් වර්ණ චිත්‍ර ද අමතක කරයි.'' (වික්‍රමසිංහ (2008) 125 පිටුව)

දේශීය ගැමි ජීවිත තොරතුරු සද්ධර්මරත්නාවලියේ සෑම පුවතක් පාසා ම බහාලන තත් කවියා

''යකඳුරෙකුට ළං වූ පිසාචකයෙකු මෙන් ද''(නාගසේන වස්තුව)

''උසින් මහත් වූ ලාභ සත්කාර ඇතිව කැළි බරාඬි යයි ප්‍රසිද්ධ ව'' (කාළි යක්ඛිණී වස්තුව) 95 පිටුව)

''පිරිත් බණවනු නිසා බදුන් කරා වහන්දැ අටනමක් හෝ සොළොස් නමක් හෝ එවන්ට කියා යැවුහෝ (ධම්මික වත, 142 පිටුව)

''මා අතපාරවා පුදන්ට ගෙත මල්දම් ඇත්දැයි විචාරා'' (එම 147 පිටුව)

ආදි වශයෙන් යක්‍ෂ ඇදහිල්ල, ප්‍රේත ඇදහිල්ල, භූත විශ්වාස, පිරිත් සජ්ජායනා කරවීම, ඒ සඳහා සහභාගි වන භික්‍ෂූන් පිරිස, අවසන් බණ කීම යනුවෙන් ග්‍රාම්‍ය පරිසරයේ සිදුවන සිරිත් විරිත් ඇදහිලි අනාවරණය කරන්නේ සහෘදයා ගැමි පරිසරයට කැඳවාගෙන යමින් ය.

''එවේලේ කපන ලද ගොයම් කොළ කැටියකින් මෙන් සද්ධර්මරත්නාවලියෙන් නිකුත් වන්නේ සිංහල ජනයාගේ ජීවිතය පිළිබඳ නිමවූ පුසුඹකි. අනිත් සිංහල ගද්‍ය කාව්‍යයන් කෙරෙන් බෙහෙවින් වහනය වන්නේ පුස්කොළ පොත්වල සුවඳ මිස සිංහලයන්ගේ ජීවනය නැමැති පුෂ්පයෙහි සුගන්ධ නොවේ.'' (වික්‍රමසිංහ (1991) 32 පිටුව)

රත්නාවලී කතුවරයා පූර්ව කාලීන හා සමකාලීන සමාජ පිළිබඳ තිබූ අවබෝධය ස්වකීය කතා වස්තු තුළ බහාලනු ලැබුවේ සමාජයේ සෑම පැතිකඩක් විෂයෙහි ම තත්වාවබෝධය පිළිබිඹු කර දක්වමිනි.

''සුදුසු නෙතකින් සරණ ගෙන්වා පාවා දී (චන්ද්‍රපාල, 28 පිටුව) (විවාහ සංස්ථාව ගොඩ නැගීමේ දී අනුගමනය කළ චාරිත්‍ර)

''මුන්ට සරණක් ගෙවුත් පාවා දී ලම්නම්'' (කාළියක්ඛිණී, 88)

(සාම්ප්‍රදායික විවාහ සංස්ථාව ගොඩ නැගෙනුයේ

දෙමාපිය වැඩිහිටියන්ගේ සහයෝගය සහිතව බව)

''මඟුලකට පූජාවකට මෙන් සැරහී පියා කොහි යෙත් දැයි'' (චක්ඛුපාල)

(මංගල්‍යයකට හෝ වෙනයම් ආගමික අවස්ථාවකට සම්බන්ධ වීමේ දී ඊට සුදුසු ඇඳුම් පැළඳුම්වලින් සැරසුණු බව)

''ගොපල් රක්නා ගෙරි පරිද්දෙන් (නාගසේන වස්තුව, 76 පිටුව) (ගවපාලනය පැවති බව)

''ගැල් පන්සියයක් බඩු ගෙන්වා ගෙන අවුත් වෙළඳාම් කොට''(නාගසේන, 75 පිටුව) ගැල්වලින් භාණ්ඩ ප්‍රවාහනය කරමින් වෙළෙඳාම්වල නියුක්ත වූ බව)

''ආභරණ කරවන්නට බඩාල් කෙනෙකුන් ගෙන්විය'' (රත්‍රාන් කර්මාන්තය පැවති බව) (මට්ටකුණ්ඩලී, 42)

විවාහයේ දී දායාද පාවා දීම, මංගල හා අවමංගල උත්සව, ආගන්තුක සත්කාර, ලෝහ කර්මාන්තය ඇතුළු එවකට පැවති විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයයන්, ගෘහ නිර්මාණ ශිල්පය, වාරි කර්මාන්ත, වෙළහෙළදාම් වෙදකම, වෛද්‍ය ශාස්ත්‍රය, අධ්‍යාපනය යනාදී වශයෙන් සමාජීය තොරතුරු රාශියක් තත් කථා වස්තු වලින් අනාවරණය කළේ විවිධ සමාජ ස්ථලයන් පිළිබඳ අවබෝධය සහෘදයාට ලබා දෙමින් ය.

නිගමනය

දඹදෙණි යුගයේ විරචිත සද්ධර්මරත්නාවලිය සිංහල සාහිත්‍ය වංශයේ සුවිශිෂ්ට නිර්මාණය වූයේ පාලි ධම්ම පදට්ඨ කථාවේ මූලාශ්‍රයෙන් අනුවර්තනාද්වාරයෙන් රචිත කෘතියක් නිසා ය. පූර්වකාලීන හා සමකාලීන ග්‍රන්ථ රචනයන්ට වඩා කාව්‍ය හා ලෝක ව්‍යවහාරයෙන් රචිත උක්ත කෘතිය ධර්මෝපදේශ දෘෂ්ටාන්තව ඉදිරිපත් කරන්නේ කර්මය හා කර්මපල විස්තර කරමින් ය.

අනූන වාග් රසයෙන් හා ශක්තියෙන් පිරිපුන් සද්ධර්මරත්නාවලිය රාජ නීති ආදී ශාස්ත්‍රයෙන් ද ලෝක ව්‍යවහාරයෙන් ද රචිත උපමා, උපදේශ, ප්‍රස්තාපිරුළු, උපහාසය හා රසවත් භාෂණාවලින් ද අලංකෘත ය. ග්‍රාම්‍ය පරිසරයේ පතුළට කිඳා බැස එය විවරණය කිරීමට කවියාට තිබූ නිපුනත්වයත් ප්‍රතිභා සම්පන්න විචාර කෞශල්‍යයෙන් හා සමාජ තත්ත්ව ඥානයෙන් නිර්මාණය කළේ උපහාසයෙන්, ධ්වනියෙන්, ඉඟිවැකියෙන් හා වක්‍රෝක්තියෙන් යුතු ව ය. සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික, තොරතුරු පමණක් නො ව ගැමි ජීවිතයේ සෑම පැතිකඩක් ම නිරාවරණය කරමින් කළ විග්‍රහය හේතුවෙන් සද්ධර්මරත්නාවලිය හුදෙක් අපූර්ව වස්තුවකි. නිර්මාණයකි. කවියා සතු ප්‍රතිභාව නිරූපණය කෙරෙන අතිවිශිෂ්ට කාව්‍යයකි.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක ඩබ්.ඇස්. (1995) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

කුලසූරිය ආනන්ද, (1902), *සිංහල සාහිත්‍ය 01*, සමන් මුද්‍රණාලය, කොළඹ.

ඥාණවිමල හිමි, කිරි ඇල්ලේ (2005) *සද්ධර්මරත්නාවලිය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ඥාණාලෝක හිමි, කෝදාගොඩ (1998) *අමාවතුර*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

ගුණානන්ද ගන්තලාවේ (2009) *සුබෝධාලංකාරය*, ප්‍රකාශකයෝ , සමයවර්ධන පෞද්ගලික සමාගම, මාලිගාකන්ද පාර, මරදාන.

දිසානායක මුදියන්සේ (1985) *සිංහල සාහිත්‍ය විමර්ශන*, තිලක මුද්‍රණාලය, බත්තරමුල්ල.

ධර්මකීර්ති හිමි, තලකිරියාගම (1969) (කාව්‍යාලංකාර භාරතීය කාව්‍ය විචාරය) (සංස්) කොළඹ

නාගසිංහ ප්‍රේමසිරි (2012) සද්ධර්මරත්නාවලියේ පරිවර්තන ක්‍රමෝපායක් ලෙස උපහාසය හා හාස්‍යය මතු කිරීම (ලිපිය) පී.බී. ප්‍රතිභා උවසර ශාස්ත්‍රීය සංස්කරණය, (සංස්) රංජිත් සේනානායක) විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල, කොළඹ.

නාරම්පනාව කීර්ති (2003) *භාරතීය කාව්‍ය විචාරය*, සමීප ප්‍රකාශකයෝ, පොල්දූව, බත්තරමුල්ල.

මද්දුම අමරසේවා (1995) *සම්භාව්‍ය සාහිත්‍යයට පිවිසුමක්*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රතනසාර ථෙරේන කහවේ (1919), *ධම්මපදට්ඨ කථා*, ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය, කොළඹ

වික්‍රමසිංහ මාර්ටින් (2006) *කාව්‍ය විචාර*, සරස පුද්ගලික සමාගම, කිරිමණ්ඩල මාවත, රාජගිරිය.

වික්‍රමසිංහ මාර්ටින් (1991) *සාහිත්‍යෝදය කථා*, සීමාසහිත තිසර ප්‍රකාශකයෝ, දුටුගැමුණු වීදිය, දෙහිවල.

වික්‍රමසිංහ කේ.ඩී.පී (1997) *සාහිත්‍ය ලිපි ගොන්න*, ගුණසේන සහ සමාගම, කොළඹ.

වික්‍රමසිංහ මාර්ටින්, (2008) *සිංහල සාහිත්‍යයේ නැගීම*, සරස පුද්ගලික සමාගම, කිරිමණ්ඩල මාවත, රාජගිරිය.

වික්‍රමසිංහ මාර්ටින්, (1963), *විචාර ලිපි*, සරස පුද්ගලික සමාගම, කිරිමණ්ඩල මාවත, රාජගිරිය.

වික්‍රමසිංහ කේ.ඩී.පී. (1997), *සාහිත්‍ය ලිපි ගොන්න*, ගුණසේන සහ සමාගම, කොළඹ

සන්නස්ගල පුංචිබණ්ඩා, (1961), *සිංහල සාහිත්‍ය වංශය*, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ.

සිරිසුමන හිමි තිඹිරිවැව (2019) *දඹදෙණි යුගය*, දේශපාලනික හා සංස්කෘතික සමීක්ෂා, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

හෙට්ටිආරච්චි, ඩී.ඊ. (1974) *ධම්පියා අටුවා ගැටපදය,* ප්‍රකාශනය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය

Godakumbura C.E. (1955), *Sinhalese Literature*, Apthecaries Co. Ltd. , Colombo